**විලච් ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

විලච් ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් හි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 16 හි 51 වන ජේදය අනුව, සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් හා දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.72,942,879 ක් වූ වාහන 94 ක් නැවත අගය කර ගිණුම් වලට ගෙන නොතිබුණි. | සමාගම සතු මේ වන විට ක්ෂය අවසන් හා දැනට භාවිතයේ ඇති සියලු මොටර් රථ යලි අගය කර වටිනාකම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබූ නමුත් එම වාර්තා මේ වන තෙක් හලාවත වැවිලි සමාගම වෙත ලැබී නොමැත. | ප්‍රමිතය ප්‍රකාරව වත්කම් අගයකර ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආරම්භක කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ වටිනාකමෙහි වැරදීමකින් ඇතුළත් වී තිබූ පෙර වර්ෂයන්ට අදාල රු.1,111,531 ක වියදම් නිවැරදි කිරීමේදී සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම අගයෙන් අඩුවෙන් සටහන් වී තිබුණි. | 2017 දෙසැම්බර් 31 දිනට පලුගස්වැව වතුයායේ ශේෂ පත්‍රය තුල මෙම රු.1,111,531 ක වටිනාකම කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇති අතර, වතුයායන්ගේ අවසන් ගිණුම් තුල ඒ පරිදි දක්වා ඇත. | පෙර වර්ෂයේ ලාභයට ගැලපීම් කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1994 සිට 2010 වර්ෂය දක්වා වතු යටිතල පහසුකම් සංවර්ධන හා වැඩි දියුණු කිරීම සඳහා වතු සේවක සංවර්ධන අරමුදල් මඟින් (Plantation Human Development Trust Fund) ඉදිකරන ලද වටිනාකම රු.6,479,676 ක් වූ වත්කම් වලට අදාල විස්තරාත්මක ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කිරීමට සමාගම අපොහොසත් විය. | PHDT අරමුදලින් සමාගම වෙත ලද මුදල් ප්‍රධාන ගිණුමට බැරකර සමාගමේ දායකත්වයත් සමග අදාල වර්ෂයන්වලදී වත්කම් ගිණුම් වලට හර කර ඇති අතර එසේ ඉදිකරන ලද ගොඩනැගිලි, ජල සැපයුම් වෙන වෙනම පෙන්වා ඇති අතර ආයතනයේ දායකත්වය හා PHDT අරමුදලෙන් ලැබෙන දායකත්වය ද සහිතව ඉදිකිරීම් කර ඇති නිසා ප්‍රධාන ලෙස ලැබී ඇති, රු.10,824,468 යන වටිනාකම ඉදිකල වත්කම් වටිනාකමට සමාන නොවේ. ඒ අනුව විගණකයින් පෙන්වා දී ඇති රු. 6,479,676.00 ක වත්කම්ද 1994-2010 කාලය තුල වත්කම් යටතේ ගිණුම් ගත වී ඇත. | PHDT අරමුදලින් ලද මුදල් මඟින් ඉදිකල වත්කම් වලට අදාල ක්ෂය වියදමට සමාන මුදලක් අදාල සංචිතයෙන් වර්ෂයේ ආදායමට බැර කල යුතු බැවින් එම අරමුදල් මඟින් ඉදිකල වත්කම් වෙන වෙනම හඳුනාගත හැකි ආකාරයට විස්තරාත්මක ලේඛණ පවත්වාගෙන යා යුතුය. |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරණ කළමණාකරණ සේවා චක්‍රලේඛය | දීමනා තීරණය කිරීමේදී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගතයුතු වුවත් එසේ නොමැතිව JM හා ඊට ඉහළ වැටුප් කාණ්ඩවල නිළධාරීන් 28 දෙනෙකු සඳහා රු.7,740,249 ක් "සේවක දීමනා" (Labour Allowance) ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් නිකුත්කර ඇති චක්‍ර ලේඛනයක් මඟින් සියලුම ප්‍රාදේශිය කාර්යාල වල විධායක ශ්‍රේණි නිලධාරීන්ට කම්කරු දීමනා ගෙවීමට තීරණය කර ඇත. ඒ අනුව විධායක නිලධාරීන්ට මෙම දීමනාව ගෙවීම අඛණ්ඩව සිදුකර ඇත. | දීමනා ගෙවීමට පෙර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජකාරී ඉටු කිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවහි දී සභාපතිවරයා විසින් අතිරේකව ලබා ගන්නා ඉන්ධන සඳහා රේඛීය අමාත්‍යාංශලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, සමාගමේ සභාපතිවරයා විසින් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා භාවිතාකල වටිනාකම රු.413,374 ක් වූ ඉන්ධන ලීටර් 3,082 ක් සඳහා අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය ලබාගෙන ඇති අතර එය අනුමැතිය සඳහා අමාත්‍යාංශ වෙත යවා ඇත. | සභාපතිවරයා විසින් අතිරේකව ලබා ගන්නා ඉන්ධන සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |

## 1.7 ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේ ඇල්කඩුව වැවිලි සමාගමට, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට, ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට හා රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට සියයට 8 පොළියක් යටතේ වර්ෂ දෙකකින් ගෙවා අවසන් වන පරිදි ලබා දී තිබූ රු.105,000,000 ක ණය මුදල හා රු.53,157,808 ක් වූ පොළිය අයකර ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | 2018 වසරේදී වැවිලි කර්මාන්තයේ ලේකම්තුමා විසින් අදාල ආයතන ප්‍රධානින් අමාත්‍යාංශය වෙත ගෙන්වා අදාල ණය මුදල් පියවීමට පියවර ගන්නා ලෙස දැනුම්දෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලය තමා ලබාගෙන ඇති මිලියන 40ක ණය මුදල පියවීමේ පියවරක් ලෙස හලාවත වැවිලි සමාගමේ කොළඹ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා සුදුසු ගොඩනැගිලි පරිශ්‍රයක් ලබාදීමට එකඟතාවය පලකර ඇති අතර මේ දිනවල ඒ පිළිබඳව කටයුතු සිදුකෙරමින් පවතී. | අදාල ණය මුදල් හා පොළිය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.35,178,696 අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.126,414,733 ක් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 161,593,429 කින් පිරිහී තිබුණි. මෙම පිරිහීමට පොල් අලෙවි ආදායම රු.200,668,747 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2010 වර්ෂයේදී ස්ථාපිත කරන ලද වටිනාකම රු.6,062,657 ක් වූ තෙල් පිරිපහදු පද්ධතිය මඟින් ගිවිසුම අනුව කොප්පරා කිලෝග්‍රෑම් 01 කින් තෙල් කිලෝග්‍රෑම් 0.6 ක් නිෂ්පාදනය කළ යුතු වුවත්, එම පද්ධතිය මඟින් නිෂ්පාදන කළ හැකි තෙල් කිලෝග්‍රෑම් 0.5 ක් පමණක් වීය. ඒ අනුව අදාල පද්ධතිය අලුත්වැඩියා කර ගැනීමට හෝ ගිවිසුම අවලංගු කර වෙනත් පද්ධතියක් ස්ථාපිත කර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව නෛතික ක්‍රියාමාර්ග ගෙන ගෙවීමට ඇති මුදල අවලංගු කිරීමට අවධානය යොමුකර ඇත. | ගිවිසුම අනුව තෙල් පිරිපහදු පද්ධතියෙන් අපේක්ෂිත නිෂ්පාදන නිමැවුම ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සමාගමේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව සහකාර සමාන්‍යාධිකාරී(වැවිලි) තනතුරට සමාගමේ සියලු වතු ආවරණය වන පරිදි රාජකාරි ඉටුකල යුතු වුවද, 2014 නොවැම්බර් 18 දින එම තනතුරට පත්කල නිළධාරියාගේ සේවය වතු 02 කට හා එක් ව්‍යාපෘතියකට පමණක් සීමාකිරිමට ගනු ලැබූ කළමණාකරණය තීරණය හේතුවෙන්, එම තනතුරේ සේවය ඌන උපයෝජනය වී තිබුණි. | 2015 දෙසැම්බර් 08 සහ 2016 පෙබරවාරි 11 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ගත් තීරණයක් අනුව විධායක අධ්‍යක්ෂගේ 2016 පෙබරවාරි 11 දින දරණ ලිපිය මඟින් පලුගස්වැව සහ තම්බපණ්ණි යන වතු කොට්ඨාශද කජු ව්‍යාපෘතියද කළමනාකරණය කිරීමේ වගකීම වැවිලි සහකාර සාමාන්‍යාධිකාරී වෙත පවරා ඇත. | බඳවාගැනීමේ කාර්යය පරිපාටියට අනුව සහකාර සමාන්‍යාධිකාරී(වැවිලි) තනතුරට පැවරි ඇති රාජකාරි සියළු වතු ආවරණය වන පරිදි ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාගම විසින් කිණියම වතු කොටසේ පවත්වාගෙන යනු ලබන බීජ පොල් උයනට ජලය ලබාගැනීම සඳහා 2018 මාර්තු 19 වෙනි දින රු.1,386,929 ක පිරිවැයකට විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද, ජල නළ එළීමේ කටයුතු 2019 වර්ෂයේ අගෝස්තු 31 දින වන විටත් අවසන් නොකිරීම හේතුවෙන් එම යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබුණි. | මෙම බීජ පොල් උයන සම්පූර්ණයෙන්ම පොල් පර්යේෂණ ආයතනයේ තාක්ෂණික උපදෙස් මත ක්‍රියාත්මක වන්නකි. ජල සම්පාදනය සඳහා ජෙනරේටරයක් ලබාගෙන තිබුණද ජල නළ එළීම පොල් පර්යේෂණ ආයතනය මඟින් සිදුකල යුතුව තිබුණි. කෙසේ වෙතත් මේ වන විට එකී ජල නළ එළීම නිමකර ඇත. | කාර්යන් ඉටු කිරීමේ අනුපිළිවෙල අනුව භාණ්ඩ මිලදී ගැනීමට හා භාවිතා කිරීම කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සමාගමේ වතුයායන්හි ආරම්භ කර පැවති 145,549 ක් වූ පරිනත නොවූ පොල් වගා අධීක්ෂණයේ හා නඩත්තු කටයුතුවල පැවති දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගස් 48,579 ක් එනම් සියයට 34 ක් විනාශ වී පැවතුණි. | වගාවන් විනාශ වීම ජල ඌණතා මත පමණක් සිදුනොවන අතර පලිබෝධ හානි, කාලගුණික විපර්යාස, පරිසර තත්ව සහ පාංශු තත්ව යටතේද සිදුවේ. | වගාවක් ආරම්භ කිරීමේ සිට පරිනත වන තෙක් එම වගාවේ වර්ධනයට අවශ්‍ය සියලු සාධක නියමිත පරිදි ලැබෙන ලෙස වගාවක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ) බිංගිරිය හා හලාවත වතුයායන්හි සෘජු පොහාර යෙදීම සිදු කර ඇති අතර, ඒ අනුව පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව පරිනත පොල් ගසකට යූරියා ග්‍රෑම් 800 ක් යෙදිය යුතු වුවත්, වතු කළමණාකරණය විසින් ගසකට ග්‍රෑම් 800 - 1200 අතර ප්‍රමාණයක් යෙදීම හේතුවෙන් යූරියා කිලෝ ග්‍රෑම් 51,052 ක් සම්මත ප්‍රමාණයට වැඩියෙන් යොදා තිබුණි. | පොහොර ඇස්තමේන්තු කිරිම පසුගිය වර්ෂයකදි වතුවල පත්‍ර විශ්ලේෂණය මගින් පොල් පර්යේෂණ ආයතනය මඟින් ලබාගන්නා ආන්තරික පොහොර නිර්දේශයන්ට අනුව සිදුකරන බැවින් සම්මත අගයන්ගේ වෙනස්කම් ඇත. | පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශනය අනුව සෑම ගසකටම ඒකාකාරි වන ලෙස පොහොර යෙදීම මඟින් ඵලදාව වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ ප්‍රකාරව රසායනික පොහොර යොදන සෑම පරිනත | පොල් පර්යේෂණ ආයතනය විසින් පස සහ පොල් පත්‍ර විශ්ලේෂණය කිරිමෙන් පසු | පර්යේෂණ ආයතනයේ නිර්දේශිත ප්‍රමාණයෙන් |

| | | | |
|---|---|---|---|
| | පොල් ගසක් සඳහා ඩොලමයිට් කිලෝග්‍රෑම් 01 ක් යෙදිය යුතු වුවත්, සමාගම විසින් ගස් 119,788 ක් සඳහා කිලෝග්‍රෑම් 2 බැගින් යෙදීම හේතුවෙන් ඩොලමයිට් කිලෝග්‍රෑම් 116,280 ක් සම්මත ප්‍රමාණයට වැඩියෙන් යොදා තිබුණි. | නිර්දේශ කරනු ලබන ආන්තරික පොහොර නිර්දේශයන් මත සමහර වතුයායන් සඳහා ඩොලමයිට් කිලෝ ග්‍රෑම් 2 බැගින් යෙදීම සිදුකර ඇත. පැළ වගාවට පොහොර කිලෝ 8,535ක අඩුවෙන් යෙදීමේ වෙනස පොහොර යොදන අවස්ථාවේ පැළ මියගොස් තිබීම, වර්ධිත පැළ තිබීම වැනි සාධක මත සිදුවිය හැක. | ඩොලමයිට් පොහොර යෙදීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | පොල් පර්යේෂණ ආයතනයේ සම්මතයන්ට අනුව පොල් ගසක වාර්ෂික සමාන්‍ය ඵලදාව පොල් ගෙඩි 72 ක් පමණ විය යුතු වුවත්, සමාගම විසින් ඵලදාව වැඩිකරගැනීමට පියවර නොගැනිම හේතුවෙන් පාලනය කරනු ලබන වතු 06 ක එම අගය 11-36 අතර ඉතා අඩු පරාසයක පැවතුණි. | පොල් ගසක වාර්ෂික සාමාන්‍ය ඵලදාව පොල් ගෙඩි 72ක් නොවන අතර සමාගමේ 2018 වසරේ පොල් ඵලදාව අඩුවීම ගසක වාර්ෂික සාමාන්‍ය පොල් ඵලදාව අඩුවීමට බලපා ඇත. | සමාගම විසින් ගසකින් අවම වශයෙන් ගෙඩි 72 ක් ලැබෙන පරිදි පොල් වගාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු යෙදිය යුතුය. |
| (ඉ) | 2013 වර්ෂයේ ශාන්ත ජෝන් බී හා මරිච්චිකට්ටුව වත්තේ හෙක්ටයාර් 20.75 ක කජු පැල 4,131 ක් වගාකර ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.7,058,205 ක වියදමක් දරා තිබූ නමුත් නඩත්තු කටයුතු සිදු නොකිරීම හා අධීක්ෂණ කටයුතු දුර්වලතා හේතුවෙන් සමස්ථ වගාවෙන් ගස් 3,685 ක් එනම් සියයට 89 ක් විනාශ වී තිබුණි. | ස්ථාපිත කල කජු වගාවද අධික වර්ෂාපතනය ඇති අවස්ථාවල ජලයෙන් යටවීම නිසාද ශුෂ්ක කලාපයේ පිහිටීම නිසා ඇති වූ නියඟ තත්වයන් නිසාද මෙම වගාවට හානි සිදුවිය. | කජු වගාවක් ආරම්භ කිරීමට පෙර වගාව සඳහා පැවතිය යුතු පාංශු හා පාරිසරික සාධක පිළිබඳ අධ්‍යනයක් කළ යුතු අතර, වගාකරන ලද පැල ආරක්ෂාකර ගැනීම සඳහා වගා අධීක්ෂණ කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යා යුතුය. |
| (ඊ) | සමාගම හා පොල් පර්යේෂණ ආයතනය එකාබද්ධව 2012 වර්ෂයේදී බිංගිරිය වතුයායට අයත් හෙක්ටයාර් 58 ක පැල 8363 කින් යුත් පොල් වගාවක් ආරම්භ කර තිබුණද, වගා කටයුතු අධීක්ෂණයේ පැවති දුර්වලතා හේතුවෙන් පැල 2691 ක් එනම් සියයට 32 ක් පමණ සමාලෝචිත වර්ෂය අවසන් වන විට විනාශ වී තිබුණි. | අඩු වර්ෂාපතනයක් ලැබීමේ තත්වය තුල විශාල වගාවක් දෛනිකව නඩත්තු කටයුතු කිරීමට ඇති මානව සම්පත් හිඟය, පැළ කුඩා කාලයේ වේයන්, ඉත්තෑවුන් සහ කුරුමිණියන්ගේ සිදුවන හානි පොල් පැළ ප්‍රමාණය අඩුවීමට බලපා ඇත. | පොල් පර්යේෂණ ආයතනයෙන් ලැබෙන උපදෙස් අනුව, වගාව අධීක්ෂණය කර පවත්වාගෙන යා යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාගමට අයත් බිංගිරිය වතුයායේ පිහිටි පළාත් මාරවිල II වැව ප්‍රතිසංස්කරණය කිරීම හා එමගින් ඉවත්වන රොන් මඩ කියුබ් 35,000 ක් රු. 1800 බැගින් සමාගමට ගෙවා ඉවත්කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි 11 දින ගිවිසුමකට එළඹ තිබුණද, ගිවිසුම්කරු රොන් මඩ ඉවත් කරගෙන තිබුණද, ඊට අදාල මුදල් අයකර ගැනීමට හෝ රොන්මඩ ඉවත් කිරීම නතර කිරීමට සමාගම නීතිමය පියවර ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත්කරු 2018/01/11 වන දින මාරවිල II වැව ප්‍රතිසංස්කරණයට අදාලව ලියාපදිංචි කල ගිවිසුම් අංක 1359 යටතේ රුපියල් මිලියන 63 ක් හලාවත වැවිලි සමාගම වෙත මුදලින් ගෙවීමට අදාලව මාස 09 කට වලංගු වන පරිදි ගිවිසුම්ගත වුවද කොන්ත්‍රාත්කරු මාස 05 කට ආසන්න කාලයක් ගතවන තෙක් කැණීම් කටයුතු ආරම්භ නොකල අතර, ගිවිසුමට අදාල කාර්ය සාධන ඇපකර මුදල් ද නොගෙවා තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු සමාගම අපේක්ෂා කළ තක්සේරුවටත් වඩා වැඩි වටිනාකමක් සමාගමට ගෙවීමට එකඟ වී සිටි බැවින් රුපියල් 1,000,000 ක කාර්ය සාධන ඇප මුදල් වාරික 04 කින් ගෙවන ලෙසට දින 28 ක සහන කාලයක්ද ඇතුලත් කර 2018/07/25 දින දෙපාර්ශවය විසින් නැවත අත්සන් කරන ලදී. එම ගිවිසුමෙහි වලංගු කාලය 2018/08/23 දිනින් අවසන් වීමට තිබූ බැවින් 2018/07/28 දින පස් කියුබ් 83 ක් වෙනුවෙන් රුපියල් 149,400 ක මුදලක් බිංගිරිය වතු කාර්යාලයට ගෙවා මැටි කියුබ් එකක් පමණක් වැව තුළින් ඉවත්කර ගන්නා ලදී. කෙසේ වෙතත් හලාවත වැවිලි සමාගම විසින් වාර්ෂිකව කන්න ක්‍රමය යටතේ බදු දෙන රුවන්එළිය කුඹුරු යායට මැදිව හලාවත වැවිලි සමාගම විසින් භුක්ති විඳින ලද මෙම වැව හලාවත වැවිලි සමාගම අයත් බවට හා එහි අනවසරයෙන් කැණීම් කරනු ලබන පාර්ශවයන් හට එම ක්‍රියාවෙන් වැලකෙන ලෙසට තහනම් නියෝගයක් ලබා ගැනීම වෙනුවෙන් නඩු අංක 1023/L යටතේ කුළියාපිටිය දිසා අධිකරණයේ නඩු පවරා ඇත. | එළැඹ තිබූ ගිවිසුම අනුව ඉවත් කරන ලද රොන්මඩ සඳහා මුදල් අයකර ගැනීමට හෝ රොන්මඩ ඉවත් කිරීම නතර කිරීමට නිතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | හලාවත වතුයායට අයත් මාවතගම වතු කොටසෙහි අක්කර 40 ක පමණ පිහිටි කලුගලක් 2012 වර්ෂයේ සිට අනවසර පුද්ගලයින් විසින් කැනීම් කර තිබූ අතර සමාගම විසින් එම අනවසර කැණීම් නතර කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019/08/23 දින සමාගම විසින් තෝරාගන්නා ලද බලයලත් මිනින්දෝරුවරයා මගින් ඉඩම් මැනීම ඉදිරි දින 14 ක් ඇතුලත සිදුකරනු ලබයි. තවද, මායිම් නිශ්චය කරගත් පසුව කලු ගල සම්බන්ධව තාක්ෂණික දත්ත ඇතුළත් වාර්තාවක් සකසා ඒ අනුව කලු ගල කැඩීමට බදු දීමට ප්‍රසම්පාදන කැඳවීම සිදුකරන බවද වැඩිදුරටත් දන්වමි. | සමාගම සතු ඉඩම් මැනීම් කර ඒ අනුව වැට මායිම් පවත්වා ගෙන යා යුතු අතර, අනවසර අත්පත්කර ගැනීම් හා ක්‍රියාකාරකම් අනාවරණය වන පරිදි වතු අධික්ෂණ කටයුතු |

| | | |
|---|---|---|
| | | පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) 1992 වර්ෂයේ සමාගම ස්ථාපිත කරන අවස්ථාවේදී පැවරුණු වටිනාකම රු.142,502,287 ක් වූ ඉඩම් හෙක්ටයාර් 5,733 න් හෙක්ටයාර් 187.44 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට බාහිර පාර්ශවයන් විසින් අත්පත්කරගෙන තිබූ නමුත් එම ඉඩම් වලට අදාල පිඹුරුපත් සමාගම සතුව නොතිබීම හේතුවෙන් අයිතිය නිරවුල් ලෙස ඉදිරිපත්කර අනවසර අත්පත්කර ගැනීම් වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කළමණාකරණය අපෝසත් වී තිබුණි. | හෙක්ටයාර් 18.21 ක ප්‍රමාණයක් ඉඩම් ලේඛණය යාවත්කාලීන නොවීම හේතුවෙන් මගඇරී ඇත.<br><br>හෙක්ටයාර් 27.92 ක ප්‍රමාණයක් 2001 වර්ෂයේදී ක්‍රිඩා පිට්ටනියක් ඉදිකර ඇති අතර වර්තමානයේ වන විට රජයේ මැදිහත්වීම මත එහි නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකර ඇත.<br><br>හෙක්ටයාර් 11.34 ක ප්‍රමාණයක් 1978 දී පමණ බදු පදනම මත ගොවීන්ට ලබාදීමෙන් පසු අඳගොවීන්ට හිමිවී තිබේ.<br><br>බදු ගිවිසුමට අනුව මෙම වත්ත හෙක්ටයාර් 149.49 ලෙස සටහන් වුවත් ඇස්තමේන්තුවල සඳහන් වන්නේ හෙක්ටයාර් 23.47 ක් ලෙසයි. වොයිස් ඔෆ් ඇමැරිකා වෙත මෙම ඉඩම ලබාදී ඇතත් එම ප්‍රමාණය සහ ලබාදී ඇති කාලය පිළිබඳ ලිඛිත සාක්ෂි සොයාගත නොහැක.<br><br>1984 වර්ෂයේදී පැවති රජය විසින් ඉඩම් හෙක්ටයාර් 81.25 ක් සරණාගතයින් පදිංචි කිරීම සඳහා යොදාගෙන තිබුණද ඒ පිළිබඳව ලිඛිත සාක්ෂි නොමැත.<br>සිත්තම්පලම් වත්ත ඉඩම් ප්‍රතිසංස්තරණ කොමිසන් සභාව යටතේ පැවති කාලය තුලදී මෙම ඉඩම් ප්‍රමාණය අහිමි වී ඇත. මේ සඳහා ලිඛිත සාක්ෂි නොපවතී. | සමාගම සතු මැනීම් කර නොමැති ඉඩම්, මැනීම් කර ඒ අනුව මායිම් ලකුණුකල යුතු අතර අනවසර අත්පත්කර ගැනීම් වලට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් වටිනාකම රු.11,731,343 ක් වූ ඉදිකිරීම් කටයුතු 04 ක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබූ අතර, සැලස්මෙහි ඇතුලත් නොවූ ලොරි රථයක් මිලදී ගැනීම, දැව තක්සේරු කිරීම හා භාණ්ඩ මිලදී ගැනීම් සඳහා රු.21,477,313 ක් වැයකර තිබුණි.ඒ අනුව ප්‍රසම්පාදන සැලසුමට අනුව සමාගම කටයුතු කර නොතිබුණි. | 2018 පොල් මිල පහළ යාම හා ඵලදාව අඩුවීම මත වර්ෂය තුල සිදුකිරීමට අපේක්ෂිතව තිබූ ඉදිකිරීම් නොකරන ලදී. නමුත් රු.21,477,313 ක් වූ ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂය තුළ සිදු කිරීමේදී බොහොමයක් වර්ෂයේ ඇස්තමේන්තුවේ ප්‍රතිපාදනයට යටත්ව සිදුකර ඇති නමුත් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවී ඇත. | අනුමත ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් වැඩ සහ භාණ්ඩ මිලදීගැනීම් සිදුකල යුතු අතර, සැලසුම් නොකල කාර්යයන් සිදුකිරීමට පෙර ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර ඒ අනුව කටයුතු කල |

යුතුය.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් 2017 ජුලි 25 දින රු.173,000 ක වියදමක් දරමින් ප්‍රසිද්ධ පුවත් දැන්වීමක් මඟින් විගණන සහකාර හා කළමණාකරණ සහකාර තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවා තිබූ නමුත් එම බඳවා ගැනීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි. | 2017 ජුනි 25 දින පුවත්පත් දැන්වීම අනුව අදාල පත්වීම් සිදුකරගැනීමට නොහැකි වූ නිසා එම අඩුපාඩුව ආවරණය කර ගැනිම 2018 වසරේදි වතු කාර්යය මණ්ඩලයට පත්කරන ලද සේවකයින් 06 දෙනෙකු ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කරගෙන තිබේ. | සුදුසුකම් සහිත අයදුම්කරුවන් අදාල තනතුරුවලට බඳවාගැනීමට කටයුතු කළ යුතුය |